64528

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2567** - දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2020/2021/2022 (2023)

**04 S**

**(04) බෞද්ධ සංස්කෘතිය**

පැය තුනයි

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.**

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

● **මෙම ප්‍රශ්න පත්‍රය කොටස් හතරකින් සමන්විත වේ. යටත් පිරිසෙයින් එක් කොටසකින් එක් ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## I කොටස

1. (i) බෞද්ධ ඉගැන්වීම් අනුව පැවිද්දා ගැන හැඳින්වීමක් කොට පැවිදි ජීවිතයෙහි අවස්ථා පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
   (ii) පැවිද්ද අපේක්ෂා කරන දරුවා දෙමව්පියන්ගේ අවසරය යටතේ විහාරස්ථානයට පැමිණීම හා එහිදී අනුගමනය කෙරෙන ආගමික සිරිත් විස්තර කරන්න. (ලකුණු 06 යි)
   (iii) සාමණේර පැවිද්දා විසින් පිළිපැදිය යුතු සිල්පද නම් වශයෙන් දක්වා ඒවා අෂ්ටාංග උපෝසථ ශීලයට වඩා වෙනස් වන ආකාරය විමර්ශනය කරන්න. (ලකුණු 08 යි)

2. (i) ආදර්ශවත් පැවිදි කුලපුත්‍රයාගේ දෛනික ජීවිතය ගතවන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)
   (ii) සිවුපසය පිළිගැනීමේදී හා එය පරිභෝගයේදී පැවිද්දා අනුගමනය කළ යුතු පොදු සිරිත් හඳුන්වා දෙන්න. (ලකුණු 06 යි)
   (iii) දහවල් දානයෙන් පසු පස්වරුවේදී භික්ෂූන්ගෙන් ඉටුවන කාර්යභාරය ගැන ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි)

3. (i) භික්ෂුවක පරිභෝජනය කරන සිවුරු කට්ටලය හඳුන්වා එය භාවිත කළ යුතු අවස්ථා විස්තර කරන්න. (ලකුණු 06 යි)
   (ii) සිවුරු හැඳීම හා පෙරවීම ආශ්‍රිතව පවත්නා සේඛියා සිඛපද පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
   (iii) භික්ෂුවගේ සිවුරු පරිභෝගය හා ගිහියාගේ ඇඳුම් පැළඳුම් පරිභෝගය ආශ්‍රිතව පවත්නා අරමුණු හා පරමාර්ථවල පවත්නා අසමානතා විමර්ශනය කරන්න. (ලකුණු 08 යි)

## II කොටස

4. (i) තම වාසය සඳහා භික්ෂූන් ස්වභාව සෞන්දර්යයෙන් පිරුණු පර්වත හා වනපෙත් ආශ්‍රිත ප්‍රදේශ තෝරා ගැනීම හා එයට හේතු වූ කරුණු ගැන ලක්දිව මිහින්තලය හා වෙස්සගිරිය පාදක කොට ගෙන විස්තරයක් කරන්න. (ලකුණු 06 යි)
   (ii) බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පය යටතේ දාගැබ් වහන්සේට වැදගත් ස්ථානයක් හිමිවන ආකාරය දක්වා මහින්දාගමනයෙන් පසු ලක්දිව පිහිටුවන ලද ථූපාරාම දාගැබ ගැන විස්තරයක් කරන්න. (ලකුණු 06 යි)
   (iii) බෞද්ධ චෛත්‍යයක තිබිය යුතු අංග මොනවාදැයි අනුපිළිවෙළින් විමර්ශනය කරන්න. (ලකුණු 08 යි)

[ 2 වැනි පිටුව බලන්න.

5. (i) බෝධිය හා පටිමා ඝර හෙවත් පිළිම ගෙය බෞද්ධයන්ට වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(ii) බෝධිඝරය හා එය තැනීමේ අරමුණු පැහැදිලි කර ලක්දිව පිහිටි පැරණි බෝධිඝර දෙකක් ගැන විස්තර සපයන්න. (ලකුණු 06 යි)

(iii) බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩසිටිද්දී පවා බෝධීන් වහන්සේ පුදපූජාවලට පාත්‍ර වූ ආකාරය විමර්ශනය කරන්න. (ලකුණු 08 යි)

6. (i) වටදාගෙය හඳුන්වා මැදිරිගිරිය හා තිරියාය වටදාගේ ගැන විස්තරයක් කරන්න. (ලකුණු 06 යි)

(ii) ටැම්පිට පිළිම ගේ හඳුන්වා ලක්දිව පවත්නා ටැම්පිට පිළිම ගෙවල් දෙකක් ගැන තොරතුරු සපයන්න. (ලකුණු 06 යි)

(iii) උපෝසථාගාර හඳුන්වා ලක්දිව පිහිටි උපෝසථාගාර දෙකක් ගැන කරුණු දක්වන්න. (ලකුණු 08 යි)

## III කොටස

7. (i) 'අරහං' හා 'පුරිසදම්ම සාරථී' බුදුගුණ මුල්කොට රචිත ගද්‍ය කාව්‍ය, ඒවා රචිත කාලවකවානු හා ඒවායේ කතුවරුන් ගැන තොරතුරු ඇතුළත් විස්තරයක් කරන්න. (ලකුණු 06 යි)

(ii) සිංහල පද්‍ය කාව්‍යයට අයත් බෞද්ධාගමික නොවන පද්‍ය කාව්‍ය මොනවාදැයි හඳුන්වන්න. (ලකුණු 06 යි)

(iii) කව්සිළුමිණ හා කාව්‍යශේඛරය යන පද්‍ය ග්‍රන්ථවල ආකෘතිය හා වස්තු විෂය ගැන විමර්ශනයක් කරන්න. (ලකුණු 08 යි)

8. (i) විද්‍යාචක්‍රවර්ති පඬිවරයා විසූ කාලය හා ඔහු විසින් රචිත ගද්‍ය කාව්‍ය ගැන විස්තරයක් කරන්න. (ලකුණු 06 යි)

(ii) සද්ධර්මරත්නාවලියේ අභිමත කථාවක් තෝරා ගෙන එමගින් පොදු ජනතාව යහමඟට යොමු කිරීම සඳහා ධර්මසේන හිමියන් දැරූ උත්සාහය කොතෙක් දුරට සාර්ථක වී දැයි පහදන්න. (ලකුණු 06 යි)

(iii) මානව චර්යා අව්‍යාජ ආකාරයෙන් නිරූපණය කිරීමට ජාතක කතා කතුවරයා දැරූ උත්සාහය ගැන විමර්ශනයක් කරන්න. (ලකුණු 08 යි)

## IV කොටස

9. (i) බුරුමයේ බුදුදහම දියුණුව උදෙසා අනවරථ හෙවත් අනුරුද්ධ රජතුමාගෙන් සැලසුණු සේවය හෙළි කරන්න. (ලකුණු 06 යි)

(ii) බුරුමයේ පිහිටි කල්‍යාණි ශිලා ලිපියේ ශාසනික වැදගත්කම පහදන්න. (ලකුණු 06 යි)

(iii) බුරුමයේ අමරපුර නිකාය ලංකාවේ පිහිටුවීම හා එයට හේතු වූ කරුණු ගැන විමර්ශනයක් කරන්න. (ලකුණු 08 යි)

10. (i) තායිලන්තයේ පවත්නා ථෙරවාද භික්ෂු නිකාය දෙක ගැන විස්තරයක් කරන්න. (ලකුණු 06 යි)

(ii) චීනයේ භික්ෂුණී ශාසනය පිහිටුවීම ආශ්‍රිත තොරතුරු විමර්ශනය කරන්න. (ලකුණු 06 යි)

(iii) වැලිවිට සරණංකර මාහිමියන් විසින් තායිලන්තයේ අනුග්‍රහය යටතේ ලක්දිව බුදුසමයේ පුනරුදය උදෙසා සලසන ලද සේවය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 08 යි)

* * *

PAST PAPERS WIKI

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library